**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (දෑ අවුරුදු) 2017/2019 සහ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (එක් අවුරුදු) 2017/2018**

**දෙවන සෙමෙස්තරය**

**MAS 611 – සමාජය හා පරිසරය**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

**කාලය : පැ ගුණයි (03)**

---

1. 'අතීතයේදී සොබාදහම මගින් සංස්කෘතිය නිර්ණය කරනු ලැබුව ද වර්තමානයේ දි සංස්කෘතිය මගින් සොබාදහම නිර්ණය කෙරෙයි.' Ulrich Beck ගේ මෙම ප්‍රකාශය අදාල උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

2. 'පරිසරය දේශපාලනකරණය වීම සහා තුන්වන ලෝකයේ නගරයන්හි පවත්නා බල සම්බන්ධතාව බොහෝ විට නාගරික ප්‍රජාව හා නාගරික පරිසරය අතර ඇති යහපත් සම්බන්ධතාව තිරණාත්මක ලෙස බලපාන්නේය.' උදාහරණ සපයමින් විචාර පූර්වකව සාකච්ඡා කරන්න.

3. අවධානම පිළිබඳ සමාජ විද්‍යාව කෙටියෙන් පැහැදිලි කොට නූතන සමාජයේ පාරිසරික අවධානම සමාජීය වශයෙන් නිර්මාණය කරනු ලබන ආකාරය විවිධ පාරිසරික කතිකාවන් ඇසුරින් සාකච්ඡා කරන්න.

4. පරිසර ව්‍යාපාරයක් යනු කුමක් දැයි නිර්වචනය කොට ශ්‍රී ලංකාවෙහි බිම් මට්ටමේ පරිසර ක්‍රියාකාරකම් ඉන්දියානු පාරිසරික වාදයෙන් වෙනස් වන ආකාරය උදාහරණ සහිතව විමසන්න.

5. සමකාලීන ලාංකේය සමාජයේ අත්දැකීම් පදකම් කරගනිමින් පහත සදහන් මාතෘකා වලින් **<u>එකක් (01)</u>** පිළිබඳ විචාරාත්මක රචනාවක් ලියන්න.

   (i) ආපදා දේශපාලනය

   (ii) වනසත්ව සහ මිනිස් ගැටුම්

*අ.පි.බ.*

6. 'ලාංකේය සමාජයේ ඝණ අපද්‍රව්‍ය ජනනය හා බැහැර කිරීමේ භාවිතාවන් ප්‍රධාන වශයෙන් සමාජ සංස්කෘතික සාධක මත රදා පවතී.' මෙම ප්‍රකාශය Mary Douglas ගේ අදහස් යොදා ගනිමින් සාකච්ඡා කරන්න.

7. මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය සහ එහි තිරසාර බව පිළිබඳ ශක්‍යතාව කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලාංකේය ජල සම්පත් කළමණාකරණ ක්‍රියාවලිය අදාළ උදාහරණ සපයමින් විචාරාත්මකව විමසන්න.

8. පහත සඳහන් ඕනෑම මාතෘකා **<u>දෙකක් (02)</u>** පිළිබඳව කෙටි රචනාවක් ලියන්න.

   (i) සංස්කෘතික පරිසර විද්‍යාව
   
   (ii) ජීවිකා පරිසර වාදය
   
   (iii) ඉදිකරන ලද පරිසරය

**************